සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# කතෝලික ධර්මය

**8 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. දෙවියන් වහන්සේගේ ගැලවීමේ සැලැස්ම ඉටු කිරීමට තෝරා ගත් පුද්ගලයින් අතරින් පළමුවැන්නා වූයේ,
    (1) ආදම් ය. (2) ආබ්‍රහම් ය.
    (3) මෝසෙස් තුමාය. (4) ක්‍රිස්තුන් වහන්සේය.

02. ''යුක්තියට සාපිපාසා ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. ...................................................'' මෙහි හිස්තැනට සුදුසු වාක්‍ය ඛණ්ඩය වන්නේ,
    (1) ඔවුහු දයාව ලබන්නෝය.
    (2) ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝයැයි කියනු ලබන්නෝය.
    (3) ඔවුහු තෘප්තිමත් වන්නෝය.
    (4) ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය.

03. ''පාළු කරයේ මොරගා කියන හඬ'' යනුවෙන් හැඳින්වෙන්නේ,
    (1) මෝසෙස්තුමාවය. (2) එලියා දිවැසිවරයාය.
    (3) ස්නාවක ජුවාම්තුමාය. (4) හේෂුවාය.

04. අපගේ අසල්වැසියන්ට දයා කරුණාව දැක්විය යුතු බව ඉගැන්වීමට ක්‍රිස්තුන් වහන්සේ වදාළ උපමාව නම්,
    (1) රන්කාසි දසය පිළිබඳ උපමාවයි.
    (2) ආදරවන්ත පියාගේ උපමාවයි.
    (3) මහ රෑ පුප ඉල්ලූ මිත්‍රයා පිළිබඳ උපමාවයි.
    (4) යහපත් සමරිතානුවරයාගේ උපමාවයි.

05. දෙවියන් වහන්සේ මෝසෙස් තුමාට අනාවරණය කළ නාමය වන්නේ,
    (1) ''මම පුත්‍රයාණන් වහන්සේ වෙමි.'' (2) ''මම පියාණන් වහන්සේ වෙමි.''
    (3) ''මම ස්වයම්භූ වහන්සේ වෙමි.'' (4) ''මම ස්ප්‍රීතු සාන්තු වහන්සේ වෙමි.''

06. දේව මාතාවන්ගේ නිර්මල පිලිසිඳීමේ මංගල්‍යය සමරන්නේ,
    (1) දෙසැම්බර් 08 (2) අගෝස්තු 01 (3) මාර්තු 07 (4) දෙසැම්බර් 25

07. ජන වන්දනා වර්ෂය සංවිධානය කර ඇත්තේ,
    (1) භක්ති අභ්‍යාස විකාශනය වන ආකාරයටය.
    (2) ශුද්ධවන්තයන්ගේ මංගල්‍යයන් විකාශනය වන ආකාරයටය.
    (3) මරියතුමියගේ ජීවිත සිද්ධි විකාශනය වන ආකාරයටය.
    (4) ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයේ ප්‍රධාන සිද්ධි විකාශනය වන ආකාරයටය.

08. ජන වන්දනා වර්ෂය බෙදී ඇති කාල පරිච්ඡේද ගණන වන්නේ,
    (1) දෙකකි. (2) තුනකි. (3) සතරකි. (4) පහකි.

09. ශුද්ධ වූ බයිබලය සම්බන්ධව නිවැරදි කරුණක් නොවන්නේ,

(1) ශුද්ධ වූ බයිබලය අපගේ පූජනීය ග්‍රන්ථයයි.

(2) ශුද්ධ වූ බයිබලය තුළින් අප ජීවිත ගොඩනඟයි.

(3) ශුද්ධ වූ බයිබලයේ අඩංගු වන්නේ දේව වචනයයි.

(4) ශුද්ධ වූ බයිබලය කිතුණු ජීවිතයට පමණක් පණිවිඩ ගෙනදෙයි.

10. ජපමාලයේ අභිරහස් අතර දොම්නස් අභිරහස්වල පදනම වන්නේ,

(1) ක්‍රිස්තුන් වහන්සේගේ ධර්මදූත සේවාවයි.

(2) ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයෙන් මරණය පරාජය කිරීමයි.

(3) ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය හා මරණයයි.

(4) ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීමෙන් ගැලවීම හා සතුට ලබා ගැනීමයි.

11. පූජකවරය නමැති ප්‍රසාද නිධානය ස්ථාපිත කරන ලද්දේ,

(1) මහ සිකුරාදා (2) පාස්කු ඉරිදා (3) නත්තල් දා (4) මහ බ්‍රහස්පතින්දා

12. ශාරීරික පුණ්‍ය ක්‍රියා ගණන වන්නේ,

(1) 7 කි. (2) 8 කි. (3) 6 කි. (4) 12 කි.

13. ජේසුතුමා ගෝලයන්ට ඉගැන්වූ යාච්ඤාව නම්,

(1) නමෝ මරියනී (2) ස්වාමිවාක් ආරාධනය

(3) උදය ආරාධනාව (4) දයාධිත මනස්ථාපය

14. දෙවිඳුන් සමඟ අප කරන සුහද සංවාදය ........................................ නමින් හැඳින්වේ.

(1) යාච්ඤාව (2) දේශනාව (3) ඉගැන්වීම (4) කියවීම

15. මරියතුමිය ආත්ම ශරීරය පිටින් ස්වර්ගයට රැගෙනයාමේ මංගල්‍යය පවත්වනු ලබන්නේ,

(1) දෙසැම්බර් 01 (2) දෙසැම්බර් 08 (3) අගෝස්තු 08 (4) අගෝස්තු 15

16. ජපමාල මංගල්‍යය පවත්වනු ලබන්නේ කවදාද?

(1) ඔක්තෝබර් 07 (2) ජනවාරි 15 (3) මැයි 13 (4) අගෝස්තු 15

17. මේරි අක්කා නැකත් බලන්නට ගියාය. ඇය කඩ කළ පනත කුමක් ද?

(1) දෙවන පනත (2) තුන්වන පනත (3) පළමු පනත (4) පස්වන පනත

18. නිල ජන වන්දනා ක්‍රියා ගණන කීයද?

(1) 2 යි. (2) 4 යි. (3) 3 යි. (4) 5 යි.

19. පාස්කු අභිරහස යනු ක්‍රිස්තුන් වහන්සේගේ,

(1) දුක්විඳීම, මරණය, උත්ථානයයි.

(2) මරණය, උත්ථානය, ස්වර්ගාරෝහණයයි.

(3) උත්ථානය, මරණය හා දුක්විඳීමයි.

(4) දුක්විඳීම, උත්ථානය හා ස්වර්ගාරෝහණයයි.

20. ජන වන්දනාවේ කේන්ද්‍රය වන්නේ,

(1) දිව්‍ය පූජාව (2) ප්‍රසාද නිධාන (3) දේව පනත් (4) ශුද්ධාත්ම දීමනා

21. අභිවෘද්ධි ආලේපය නමැති ප්‍රසාද නිධාන දානය කරනු ලබන්නේ,

(1) කාදිනල්තුමා (2) තේවාචාර්යතුමා (3) රදගුරුතුමා (4) පියතුමා

22. ශුද්ධ වූ සභාවේ දෘෂ්‍යමාන නායකයා වන්නේ කවුරුන් ද?

(1) පාප් වහන්සේ (2) කාර්දිනල් තුමා (3) තේවාචාර්ය තුමා (4) අගරදගුරු තුමා

23. ජන වන්දනා වසරට අත්වන සති ගණන කීයද?

(1) 54 (2) 53 (3) 52 (4) 51

24. ශුද්ධාත්ම දීමනාවක් නොවන්නේ,

(1) ප්‍රඥාව (2) තේරුම්ගැනීම (3) දැන ගැන්ම (4) ප්‍රීතිය

25. දෙවියන් වහන්සේ මෝසෙස්ට අනාවරණය වූයේ,

(1) දේදුන්නක් මඟිනි. (2) වලාකුලක් මඟිනි.

(3) ඇවිලෙන ගිනි පඳුරක් මඟිනි. (4) ගිනි වැටක් මඟිනි.

26. මේ අය අතුරින් ආදි පිතෘවරයකු වන්නේ,

(1) ආබ්‍රහම් (2) දාවිත් (3) මෝසෙස් (4) ආරොන්

27. අප ශුද්ධාත්ම මන්දිරයක් බවට පත්වන්නේ කුමන ප්‍රසාද නිධානය ලබා ගත් විටද?

(1) දිව්‍ය සත්ප්‍රසාදය (2) ප්‍රසාද ස්නාපනය

(3) අභිවෘද්ධි ආලේපය (4) පූජකවරය

28. ශුද්ධාත්මයාණන් වැඩම කළ අවස්ථාවේ ප්‍රකාශ වූ සලකුණක් නම්,

(1) ගිනිදිව් (2) දේදුන්නක් (3) මහා වර්ෂාවක් (4) තරු සමූහයක්

29. ක්‍රිතු තුමාගේ පෙරමඟ සරසන්නා වූයේ කවුරුන් ද?

(1) මෝසෙස් තුමා (2) ආබ්‍රහම් තුමා (3) ස්නාවක ජුවාම් තුමා (4) ජාකොබ් තුමා

30. දස පනතේ 6 වෙනි පනත වන්නේ කුමක් ද?

(1) මව්පියන්ට සංග්‍රහ කරව (2) සොරකම් නොකරව

(3) කාමයෙහි වැරදි ලෙස නොහැසිරෙන්න (4) ජීවිතය විනාශ නොකරන්න

- **ගැලපෙන සේ යා කරන්න.**

| | A | | B |
|---|---|---|---|
| 31. | අපගේ වන්දනාව හිමිවන්නේ, | A | ග්‍රාබියල් දේව දූතයා |
| 32. | දේව මෑණියන් දර්ශනය වූයේ, | B | ස්වාමිවාක් ආරාධනය |
| 33. | විපුල ප්‍රසාදලත් උත්තමිය මෙසේ පැවසුවේ | C | දෙවිඳුන්ට පමණි. |
| 34. | ජේසුස් වහන්සේ ඉගැන්වූ යාච්ඤාව | D | අළු බදාදා වෙනි. |
| 35. | චතාරික කාලය ආරම්භ වන්නේ | E | දෙමිනික් උස්මන් පූජකතුමාට |

The National e-learning Portal for The General Education

- ප්‍රශ්න අංක 36 - 40 දක්වා වූ ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.

36. දිව්‍ය සත්ප්‍රසාදය නමැති ප්‍රසාද නිධානය ස්ථාපිත කරනු ලැබුයේ මහ සිකුරාදා දිනකදී ය. ( )

37. ඇදහිල්ල යනු විශ්වාසයයි. ( )

38. සැබෑ අසල්වාසියා ගැන කියවෙන්නේ යහපත් සමරිතානු වරයාගේ උපමා කතාවෙනි. ( )

39. අන් අයට ගරු කිරීම එතරම් හොඳ නැත. ( )

40. දෙවියන් වහන්සේ අප අයහපත කරනවාට අකැමැතිය. ( )

## II - කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) (1) ජන වන්දනා වර්ෂය ආරම්භ වන්නේ කුමන කාලයෙන් ද?
(2) ජන වන්දනා වර්ෂයට අයත් කාල පරිච්ඡේද නම් කරන්න.
(3) පාස්කු අභිරහස යනු කුමක් ද?
(4) කොඩිගස එසවීමේ අරමුණ කුමක් ද?
(5) ශුද්ධාත්ම දීමනා 02 ක් ලියන්න.

(02) (1) ජන වන්දනාවේ අරමුණු නම් කරන්න.
(2) ජන වන්දනාව යනු කුමක් ද?
(3) ජන වන්දනා වර්ෂයට අයත් එක් කාල පරිච්ඡේදයක් ගැන කෙටියෙන් හඳුන්වන්න.

(03) (1) ජේසුස් වහන්සේගේ උපත දැනුම් දුන්නේ කවුද?
(2) දෙව් මවුන් ජපමාලය අතැතිව දර්ශනය වූ අවස්ථා 02 ක් නම් කරන්න.
(3) දෙව් මවට පැවැත්වෙන මංගල්‍යයන් නම් කරන්න.

(04) (1) යහපත් සමරිතානුවරයාගේ උපමා කතාව ලියන්න.
(2) ඉන් ඔබගේ ජීවිතයට ගත හැකි ආදර්ශය ලියන්න.

(05) (1) මනුෂ්‍යත්වය රැකගැනීමට අප කළ යුත්තේ කුමක්ද?
(2) ඔබ ඔබගේ ජීවිතයේ වර්ධනය කරගත යුතු ගුණාංග හා ත්‍යාග කළ යුතු ගුණාංග වෙන වෙනම ලියන්න.

(06) (1) ඔබ උදෙසා මුලුමනින්ම වැය කර ඔබගේ දෙමවුපියන් වෙනුවෙන් ඔබෙන් විය යුතු වගකීම කුමක් ද?
(2) ඔබගේ දෙමාපියන් රැකදෙන ලෙස ඉල්ලා දෙවිඳුන්ට යැදුමක් ලියන්න.

The National e-learning Portal for The General Education